**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #Dinamina #Lankadeepa #Mawbima #Silumina #SundayDivaina #SundayMawbima #SundayLankadeepa #Year2016 #Year2017**

කිසියම් සිදුවීමක සැකකරුවෙකුගේ නම, රැකියාව හා වෙනත් පෞද්ගලික තොරතුරු මෙන්ම සැකකරුගේ ඡායාරූපයද මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කිරීම යුතු වේද යන කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ඉතාමත් වැදගත් වේ. විශේෂයෙන්ම එවැනි තොරතුරු සෘජුවම මහජන ලැදියාවට අදාළ නොවනා මොහොතකදී සැකකරුවන්ගේ එවැනි තොරතුරු පළ කිරීම මගින් ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලික ජීවිතයට හානි පැමිණීමේ ඉඩක් තිබේ. නීතිය ඉදිරියේදී කිසියම් අයෙකු වැරදිකරුවෙකු බවට ඔප්පු වනතාක් නිවැරදිකරුවෙකු ලෙසින් සලකන බව මෙහිදී සිහිපත් කිරීම වටී. නීතියෙන් නිදොස් කොට නිදහස් කළ සැකකරුවන්ගේ තොරතුරු, එසේ නිදොස් කිරීමට පෙර මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කිරීම හරහා ඔවුන්ට පීඩාවන් සිදුවීම මෑත ඉතිහාසයේදීද නැවත නැවතත් සිදුවී ඇති බවද සිහිපත් කළ යුතු වේ.

කෙසේ වෙතත් 2016 සහ 2017 වසර දෙක සලකා බලන විට, සැකකරුවන්ගේ තොරතුරු පුවත්පත් ඔස්සේ අනාවරණය වී ඇති ප්‍රමාණය පහත වැටී තිබීම සතුටට කරුණකි.